# 1.0 හැඳින්වීම

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය යටතේ 2018 වර්ෂයේ සිට 9 වන ශ්‍රේණිය සඳහා නිපුණතා පාදක නව විෂය නිර්දේශය ක්‍රියාත්මක වේ. පෙරදිග සංගීතය විෂයයක් ලෙස හැදෑරීමෙන් ශිෂ්‍යා තුළ වර්ධනය විය යුතු ප්‍රධාන නිපුණතා 09 ක් මෙම විෂය නිර්දේශ යටතේ හඳුන්වා දී ඇත.

නව සහශ්‍රකයේ විෂයමාලා ප්‍රතිසංස්කරණය සමග දන්නා දේ සංරක්ෂණය කිරීම වෙනුවට සංස්කරණය කිරීමටත්, දැනට තිබෙන දේ නැවත ගොඩනැංවීම වෙනුවට අනාගතය ඉල්ලා සිටින දේ සම්පාදනය කිරීමටත් පාසල් සිසුන් යොමු කරවීම අත්‍යවශ්‍ය ව තිබේ. නිපුණතා පාදක විෂයමාලාව, ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් මගින් මෙම අරමුණ තවදුරටත් සාක්ෂාත් කර ගැනීමට හැකි වේ.

මෙම නව විෂය නිර්දේශය සැකසීමේ දී, පෙරදිග සංගීත ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලවලින් ලබා ගත් දත්ත, ජාතික මට්ටමමේ විභාග පරීක්ෂකවරුන්ගේ වාර්තා ඇසුරෙන් සිසුන් තුළ විශේෂයෙන් සංවර්ධනය විය යුතු විෂය කොටස් පිළිබඳ තොරතුරු පාදක කරගන්නා ලදි. එසේ ම පළාත් බද සේවාස්ථ අධ්‍යායන සැසි, විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පාසල් නියාමන පර්යේෂණ වාර්තා, කලාප මට්ටමෙන් පවත්වන ලද කාර්ය බද්ධ පරීක්ෂණ දත්ත, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ හා විද්‍යාර්ථීන්ගේ අදහස්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයන්හි තූර්ය වාදක කණ්ඩායම්වල අදහස්, සංගීත විෂය හදාරන ලද විද්වතුන්ගේ අදහස්, විද්‍යුත් මාධ්‍යයන්හි විකාශය වූ සාකච්ඡා හා වැඩසටහන් ඇසුරෙන් ලබා ගත් තොරතුරු මෙන් ම පාසල් පද්ධතියේ පෙරදිග සංගීත විෂය ඉගැන්වීම් කරන ගුරුභවතුන්ගේ හා දෙමව්පියන්ගේ අදහස් ද විෂය නිර්දේශ සම්පාදනයේ දී විශේෂයෙන් අවධානයට ලක් කරන ලදි.

සෞන්දර්ය අධ්‍යාපනය යටතේ සංගීත විෂය හැදෑරීමෙන් ශිෂ්‍යයාට පාසල් ජීවිතය තුළ පමණක් නොව පසුකාලීනව ද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍යවන සංවේදි අධ්‍යාත්මයක් හා ජීවන නිපුණතා වර්ධනය කර ගැනිමට හැකිවනු ඇත. පාසල තුළ සම්භාව්‍ය සංගීත අධ්‍යාපනය විෂයයක් ලෙස හැදෑරීමෙන් උසස් කුසලතා පිරිපුන් ශිල්පියෙකු නිර්මාණය කිරීම ප්‍රධාන අපේක්ෂාව නොවන අතර, විවිධ සංගීත සම්ප්‍රදායයන් පිළිබඳ අත්දැකීම් සාමාන්‍ය ජීවිතයට යොදා ගනිමින් උසස් වින්දන ශක්තියකින් හෙබි සංවේදී පුරවැසියකු නිර්මාණය කිරීම අපේක්ෂිත ය.

මෙම විෂය නිර්දේශය හැදෑරීමෙන් නූතන වැඩ ලෝකයට සරිලන නිපුණතාවන්ගෙන් පරිපූර්ණ වූ පුද්ගල පෞරුෂයක් අත්පත් කර දීමටත්, සංගීත විෂය ආශ්‍රිත විවිධ නිෂ්පාදන හා නිර්මාණ කාර්යයන් වන සංගීත භාණ්ඩ, සංගීත නිර්මාණ කෘති හා සංගීත තාක්ෂණය යනාදියෙහි මූලික වශයෙන් එළඹුමක් ඇති කරවීමත් අපේක්ෂා කෙරේ.

